# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1868/54 - 2014 ජුනි මස 25 වැනි බදාදා - 2014.06.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල**
**පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත**
**(262 වන අධිකාරය වූ)**
**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ**
**මහර ප්‍රාදේශීය සභාවේ**
**උප සභාපති ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

උප සභාපති සභාපති ධූරයට පත්වීම හේතු කොට ගෙන මහර ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය යටතේ, උප සභාපති වන වන්නි ආරච්චිගේ සුසන්ත සිරි නම් වූ උපසභාපති අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදයක් ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නාවූ ද, ඒ මහර ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා කුලතුංග ආරච්චිගේ ධම්මික රොෂාන් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මහර ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරි පතිරාජ ආරච්චිල්ලාගේ සුනිල් සේනාරත්න වන මම 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කුලතුංග ආරච්චිගේ ධම්මික රොෂාන් මහතා මහර ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පී. ඒ. එස්. සේනාරත්න,
තේරීම්භාර නිලධාරී,
මහර ප්‍රාදේශීය සභාව.

2014 ජුනි මස 24 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගම්පහ.

07 - 305


1A - G 19787— 60 (2014/06)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල<br>පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත<br>(262 වන අධිකාරය වූ)<br>පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ<br>නල්ලූර් ප්‍රාදේශීය සභාවේ<br>සභික ධූර පුරප්පාඩු පිරවීම**

අවසරය ලබා නොගෙන මාස තුනක කාලසීමාවක් සභාවේ රැස්වීම් වලට සහභාගී නොවීම හේතු කොට ගෙන නල්ලූර් ප්‍රාදේශීය සභාවේ සභික ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

පෙරියතම්පි කනකසපාපතිපිල්ලෙයි නම් වූ සභිකයා අයත් වන ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ නල්ලූර් ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන කුමාරසාමි කතිර්කාමනාදන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

නල්ලූර් ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරි පොන්නුතුරෙයි කුගනාදන් වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කුමාරසාමි කතිර්කාමනාදන් මහතා නල්ලූර් ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පී. කුගනාදන්,<br>තේරීම්භාර නිලධාරී,<br>නල්ලූර් ප්‍රාදේශීය සභාව.

2014 ජූනි මස 24 වන දින,<br>දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,<br>යාපනය.

07 - 306

---

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල<br>පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත<br>(262 වන අධිකාරය වූ)<br>පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ<br>බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ<br>සභික ධූරයේ පුරප්පාඩු පිරවීම**

දකුණු පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොට ගෙන බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභික ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ගමගේ චානක සම්පත් මාදුගොඩ නම් වූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ගයාන් ගිතික තල්පේ ලියනගේ මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරි අන්තෝනි බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ගයාන් ගිතික තල්පේ ලියනගේ මහතා බෝපේ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. බී. අයි. ද සිල්වා,
තේරීම් භාර නිලධාරී,
බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාව.

2014 ජුනි මස 21 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

07 - 307

---

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම**

දකුණු පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොට ගෙන බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය යටතේ, සභාපති වන ගමගේ සම්පත් චානක මාදුගොඩ නම් වූ සභාපති අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපතිවරයා වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නාවූ ද, බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා උක්වත්තේ චන්දිම හිමි නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරි අන්තෝනි බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, උක්වත්තේ චන්දිම හිමි බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. බී. අයි. ද සිල්වා,
තේරීම්භාර නිලධාරී,
බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාව.

2014 ජුනි මස 18 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

07 - 308

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.